සැ. යු. - 2019.01.04 දින පළ වූ අංක 2,105 දරන ගැසට් පත්‍රයේ III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


අංක 2,106 - 2019 ජනවාරි මස 11 වැනි සිකුරාදා - 2019.01.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | — |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 14 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2019 පෙබරවාරි මස 01 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 ජනවාරි මස 18 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය.''**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www. documents.gov. lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# විවිධ දැන්වීම්

## ශ්‍රී ලංකා ජාතික ඉදිකිරීම් සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

කේ. කේ. පියදස වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 53 (1) යටතේ "ශ්‍රී ලංකා ජාතික ඉදිකිරීම් සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි'', යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථ වලින් යුක්ත වන්නා වූ එකී "ශ්‍රී ලංකා ජාතික ඉදිකිරීම් සංගමය සංස්ථාගත කිරීමයි ඃ-

1. ඉදිකිරීම් කර්මාන්තය සහ ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් සම්බන්ධයෙන් ඇති උනන්දුව සහ ප්‍රගතිය පෝෂණය කර ප්‍රවර්ධනය කිරීම ;

2. ඉදිකිරීම් කර්මාන්තය සහ ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් නියෝජනය කරමින් රජයට අදහස් ප්‍රකාශ කිරීම සහ එවැනි නියෝජනයන් සහ අදහස් ප්‍රකාශ කිරීම් වලදී වෙනත් අයට ආධාර කිරීම, සහාය වීම සහ එක්ව කටයුතු කිරීම ;

3. ඉදිකිරීම් කර්මාන්තයේ සහ ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්ගේ අයිතීන් ආරක්ෂා කරමින් ප්‍රවර්ධනය කිරීමට සාමූහික ක්‍රියාමාර්ග ගැනීම යනාදිය වේ.

කේ. කේ. පියදස,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
නුවරඑළිය දිස්ත්‍රික්කය.

01-389